1. සාරා පොත් ප්‍රකාශකයෝ 2018/03/31 දිනට ධාරණ අගය රු.180,000ක් වූ පැරණි මුද්‍රණ යන්ත්‍රය විකුණා නව මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අපේක්ෂා කරයි.පැරණි යන්ත්‍රයේ වෙළෙඳපොල අගය රු.150,000කි.නව යන්ත්‍රයේ ගැනුම් මිළ රු.600,000කි.නව මුද්‍රණ යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 5ක් වන අතර,එම කාලය අවසානයේ සුන්බුන් අගය රු.100,000ක් ලෙසට ඇස්තමේන්තුකර ඇත.

   1.) මෙම ආයෝජනය ඇගයීමේදී අදාළ මුදල් ප්‍රවාහය අයිතම දෙකක් වටිනාකම් සහිතව ලියන්න.
   2.) මෙම ආයෝජනය ඇගයීමේදී සැලකිල්ලට නොගන්නා මුදල් ප්‍රවාහයන් නොවන අයිතම දෙකක් වටිනාකම් සහිතව ලියන්න.

2. එක්තරා සමාගමක් P නැමති භාණ්ඩය නිෂ්පාදනය කර අලෙවි කරයි.එම භාණ්ඩයෙන් ඒකක 32,000ක් අලෙවි කරන විට ආයතනයේ මුළු දායකත්වය ස්ථාවර පිරිවැයට සමාන වේ.නිෂ්පාදන ප්‍රමාණය ඒකක 40,000 ඉක්මවන විට රු.60,000ක අතිරේක ස්ථාවර පිරිවැයක් දැරීමට සිදු වේ.ඒකක 42,000 මට්ටමේ දී ස්ථාවර පිරිවැය රු.220,000කි.

   1.) ඒකක 32,000ක් නිපදවන විට ආයතනයේ ස්ථාවර පිරිවැය කොපමණද?
   2.) ඒකක 50,000ක් නිපදවා අලෙවි කරන්නේ නම්,ලාභය හෝ අලාභය කොපමණද?